**සී/ස ශ්‍රී ලංකා පරිගණක හදිසි ප්‍රතිචාර සංසදය (පෞද්ගලික) සමාගම - 2017**

-----------------------------------------------------------------------------------------------------------

සී/ස ශ්‍රී ලංකා පරිගණක හදිසි ප්‍රතිචාර සංසදය (පෞද්ගලික) සමාගමේ 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් කාලපරිච්ඡේදයේ මෙහෙයුම් කටයුතු පිළිබඳව ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2007 අංක 07 දරන සමාගම් පනතේ 150(1) වගන්තිය ප්‍රකාර ඉදිරිපත් කළ යුතු 2016 සහ 2017 වර්ෂ සඳහා වූ මූල්‍ය ප්‍රකාශන මෙම වාර්තාවේ දිනය වන විටත් ඉදිරිපත් කර නොතිබුණි. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව ප්‍රකාරව මෙම වාර්තාව ඉදිරිපත් කරනු ලැබේ.

1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් අධ්‍යක්ෂ මණ්ඩලයේ වගකීම

-----------------------------------------------------------------------

සමාගමේ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම අධ්‍යක්ෂ මණ්ඩලයේ වගකීම වේ.

2. මූල්‍ය ප්‍රකාශන

-----------------

2.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

----------------------------------

2003 ජූනි 02 දිනැති අංක පීඊඞී/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 6.5.1 වගන්තිය ප්‍රකාරව, ගිණුම් වර්ෂය අවසන් වී දින 60 ක් ඇතුළත මූල්‍ය ප්‍රකාශන සහ කෙටුම්පත් වාර්ෂික වාර්තාව විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතුය. සමාගමේ 2016 සහ 2017 වර්ෂයන්හි මූල්‍ය ප්‍රකාශන හා කෙටුම්පත් වාර්ෂික වාර්තාව මෙම වාර්තාවේ දිනය වන විටත් ඉදිරිපත් කර නොතිබුණි.

2.2 වත්කම් හා වගකීම්

---------------------

සමාගම විසින් පිළියෙල කරන ලද 2015 දෙසැම්බර් 31 දිනට වූ මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන වත්කම්, බැරකම්, ආදායම් හා වියදම් පිළිබඳ විස්තර පහත දැක්වේ.

| වත්කම් | වටිනාකම |
|---|---|
| | රු. |
| ජංගම නොවන වත්කම් | 5,210,879 |
| ජංගම වත්කම් | 37,780,174 |
| මුළු වත්කම් | 42,991,053 |
| **බැරකම්** | |
| ජංගම බැරකම් | 769,021 |
| ජංගම නොවන බැරකම් | 11,527,081 |
| මුළු බැරකම් | 12,296,102 |

| | |
|---|---|
| හිමිකම් | 30,694,951 |
| | ---------------- |
| මුළු හිමිකම් සහ බැරකම් | 42,991,053 |
| | |
| මුළු ආදායම | 35,770,926 |
| මුළු වියදම | 27,186,372 |
| | ---------------- |
| වර්ෂයේ අතිරික්තය | 8,584,554 |

2.3 නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම
---------------------------------------------------------------------------

පහත සඳහන් අනුකූල නොවීම් පිළිබඳ අවස්ථා විගණනයේදී නිරීක්ෂණය විය.

| | නීති, රීති, සහ රෙගුලාසි සඳහා යොමුව | අනුකූල නොවීම |
|---|---|---|
| (අ) | 2007 අංක 07 දරන සමාගම් පනතේ 133(1) වගන්තිය | 2006 ජූනි මස සමාගම පිහිටුවීමෙන් පසුව සමාගමේ වාර්ෂික මහාසභා රැස්වීම පවත්වා නොතිබුණි. |
| (ආ) | 2003 ජූනි 02 දිනැති අංක 12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 7.4.5 වගන්තිය | 2016 සහ 2017 දෙසැම්බර් 31 දිනට වාර්ෂික භාණ්ඩ සමීක්ෂණයන් සිදුකර නොතිබුණි. එම නිසා වත්කම්හි පැවැත්ම පිළිබඳව විගණනයේදී තහවුරු කරගත නොහැකි විය. |

03. මෙහෙයුම් සමාලෝචනය
------------------------------

3.1 කාර්යසාධනය
-----------------

3.1.1 සැලසුම් කිරීම
-----------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) 2003 ජූනි 02 දිනැති අංක පීඊඩී/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 5.1 වගන්තිය අනුව සමාගම සංයුක්ත සැලැස්මක් පිළියෙල කර නොතිබුණි.මේ නිසා සමාගමේ ඉදිරි මහපෙන්වීම් සම්බන්ධයෙන් උපාය මාර්ග සමාගම විසින් නීතිගත කර නොතිබුණි.

(ආ) 2014 පෙබරවාරි 17 දිනැති අංක 01/2014 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයට අනුව 2016 සහ 2017 වර්ෂ සඳහා සමාගම ක්‍රියාකාරී සැලැස්මක් පිළියෙල කර නොතිබුණි.

3.1.2 මෙහෙයුම් සහ සමාලෝචනය
----------------------------------

සමාලෝචිත කාලපරිච්ඡේදය තුළදී ව්‍යාපෘතීන් 04 ක් ක්‍රියාත්මක කර තිබුණ අතර ඒ සම්බන්ධයෙන් පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) ජාතික සහතිකකරණ අධිකාරිය (ජා.ස.අ) ව්‍යාපෘතිය

-------------------------------------------------------------

ජාතික සහතිකකරණ අධිකාරයක් පිහිටුවීම ව්‍යාපෘතියේ අරමුණ වන අතර සහතික සේවා සපයන්නන්ගේ (ස.සේ.ස) නියාමන ආයතනය ලෙස එය ක්‍රියාවට නැංවෙනු ඇත. සියළුම ස.සේ.ස, ජා.ස.අ. හි ධූරාවලියේ විශ්වාසනීය ආදර්ශයෙහි කොටසක් බවට පත්වන අතර එමගින් ගුප්ත ලේඛනගත කාර්යයන් සුරක්ෂිතව ඉටුකිරීම සඳහා විවිධ සමූපකාර සේවා සමිති මගින් භාවිතාකරන්නන් හට හැකි වනු ඇත.

මේ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) සමාගමේ කාර්යසාධන වාර්තාවලට අනුව 2016 සහ 2017 වර්ෂයන්හි භෞතික කාර්යසාධනය පිළිවෙලින් සියයට 40 ක් සහ සියයට 66 ක් විය. කෙසේ වෙතත්, මව් සමාගමේ ව්‍යාපෘති කාර්යසාධන වාර්තා අනුව 2016 සහ 2017 වර්ෂයන් සඳහා භෞතික කාර්යසාධනය පිළිවෙලින් සියයට 19 ක් සහ සියයට 73 ක් විය. එම නිසා ව්‍යාපෘතීන්හි සත්‍ය භෞතික කාර්යසාධනය විගණනයට තහවුරු කරගත නොහැකි විය.

(ii) මව් සමාගම විසින් ව්‍යාපෘතීන්හි භෞතික ප්‍රගතිය තීරණය කිරීමේදී, සියළුම ක්‍රියාකාරකම් අතරින් ප්‍රසම්පාදන ක්‍රියාවලිය සඳහා සියයට 30 ක බරතැබීමක් සිදුකර තිබූ අතර එයින් භෞතික ප්‍රගතිය සියයට 27 ක් ලෙස දක්වා තිබුණි. කෙසේ වෙතත්, සැලසුම් කර තිබූ ප්‍රසම්පාදනයන් 5 ක් අතරින් ප්‍රසම්පාදනයන් 2 ක් පමණක් 2017 දෙසැම්බර් 31 දිනට අවසන් කර තිබුණි. එම නිසා ප්‍රසම්පාදන ක්‍රියාවලියේ සියයට 27 ක ප්‍රගතිය විගණනයේදී ගැටළු සහගත විය.

(iii) 2016 මාර්තු 08 දින ජාතික සැලසුම් දෙපාර්තමේන්තුව විසින් දෙන ලද නිර්දේශයන්ට අනුව ජාතික සහතිකකරණ අධිකාරියේ සමහර අයිතමයන් 2004 සිට 2014 දක්වා වූ කාල පරිච්ඡේදය තුළදී ප්‍රසම්පාදනය කර තිබුණි. කෙසේ වෙතත්, 2015 දෙසැම්බර් 31 දින වන විටත් ජාතික සහතිකකරණ අධිකාරිය ක්‍රියාත්මක මට්ටමට සංවර්ධනය වී නොතිබුණි. එසේම තවත් වසර දෙකක කාලය තුළදී ද සමාගම විසින් ව්‍යාපෘතියේ ඉලක්කගත නිමැවුම ලබාකර ගෙන නොමැති බව විගණනයේදී අනාවරණය විය.

(ආ) සයිබර් ආරක්ෂණ සහ ඩිජිටල් අධිකරණ යටිතල පහසුකම් පිළිබඳ ශ්‍රී ලංකා ව්‍යාපෘතිය වැඩිදියුණු කිරීම

------------------------------------------------------------------------------------------------

ශ්‍රී ලංකා පරිගණක හදිසි ප්‍රතිචාර සංසඳය සඳහා භාණ්ඩ ප්‍රසම්පාදනය සහ සේවා ප්‍රසම්පාදනය සඳහා ව්‍යාපෘතිය අපේක්ෂා කර තිබුණි. 2016 දෙසැම්බර් 31 දිනට සමාගමේ කාර්යසාධන වාර්තා අනුව සයිබර් ආරක්ෂණ සහ ඩිජිටල් අධිකරණ යටිතල පහසුකම් පිළිබඳ ශ්‍රී ලංකා ව්‍යාපෘතියේ භෞතික කාර්යසාධනය සියයට 80 ක් විය. කෙසේ වෙතත්, මව් සමාගමේ කාර්යසධන වාර්තා අනුව භෞතික ප්‍රගතිය සියයට 19 ක් විය. එම නිසා ව්‍යාපෘතියේ සත්‍ය කාර්යසාධනය විගණනයට තහවුරු කරගත නොහැකි විය.

(ඇ) විශිෂ්ඨත්වයේ සයිබර් අපරාධ සහ සයිබර් ආරක්ෂණ මධ්‍යස්ථාන

-----------------------------------------------------------------------

සයිබර් අපරාධ සහ සයිබර් ආරක්ෂණයන්හි පුහුණු, පර්යේෂණ සහ අධ්‍යාපන සඳහා මධ්‍යස්ථාන පිහිටුවීම මගින් එම ක්ෂේත්‍රයන්හි දැනුම වැඩිදියුණු කිරීම ව්‍යාපෘතියේ අරමුණ විය. සියයට 25 ක භෞතික ප්‍රගතියක් නියෝජනය කරමින් සැලසුම් අදියර සම්පූර්ණ කිරීමෙන් පසුව අරමුදල් සීමිත වීම නිසා ව්‍යාපෘතිය නවතා දැමීමට තීරණය කර තිබුණි.

(ඇ) සයිබර් ආරක්ෂණ ධාරිතා සහ යටිතල පහසුකම් සංවර්ධනය
-----------------------------------------------------------------

2017 දෙසැම්බර් 31 දිනට ව්‍යාපෘතියේ භෞතික සහ මූල්‍ය කාර්යසාධනය පිළිවෙළින් සියයට 52 ක් සහ සියයට 27 ක් වූයේ ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේ ප්‍රමාදය නිසා විය.

3.2 කළමනාකරණ ක්‍රියාකාරකම්
--------------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) ඉ - ශ්‍රී ලංකා ව්‍යාපෘතියෙහි ප්‍රධාන අරමුදල් සපයන්නා වශයෙන් ලෝක බැංකුව විසින් තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ නියෝජිතායතනය (තො.ස.තා.නි) වෙත ස්වාධීනත්වය ලබාදීමේ අත්‍යවශ්‍යතාවය සඳහන් කිරීම හේතුවෙන්, 2003 ජූලි 16 දිනැති අංක සීඑම්පී/03/0884/134/027 දරන අමාත්‍ය මණ්ඩල තීරණය හරහා මූල්‍ය හා පරිපාලන අංශයන් සඳහා සම්පූර්ණ ස්වාධීනත්වය තො.ස.තා.නි වෙත හිමි වී තිබුණි. කෙසේ වෙතත් අමාත්‍ය මණ්ඩල තීරණය පරිදි මූල්‍ය හා පරිපාලනමය ස්වාධීනත්වය තවදුරටත් වලංගු වුවද තො.ස.තා.නි හි පරිපාලිතයක් වශයෙන් වර්තමානයේදී සමාගම සම්පූර්ණයෙන්ම ඒකාබද්ධ අරමුදල් මත පදනම්ව පවතී. තවද මූල්‍ය හා පරිපාලන අංශයන් සඳහා වන සම්පූර්ණ ස්වාධීනත්වය ලබා දී තිබුණේ ලෝක බැංකු ආධාර ලබාදීම නිසා නොව කෙටි කාලයක් තුළදී ප්‍රතිඵල ලබාදීම සඳහා වඩා සුදුසුකම් සහිත විශේෂිත පුද්ගලයින් බඳවා ගැනීම සඳහා බව සමාගම විසින් සඳහන් කර තිබුණි. කෙසේ වෙතත්, අමාත්‍ය මණ්ඩලය සංදේශයේ එවැනි ප්‍රතිපාදනයක් සලසා නොතිබුණි.

(ආ) තො.ස.තා.නි යටතේ වෙන්වූ සමාගමක් ලෙස පරිගණක හදිසි ප්‍රතිචාර සංසදය (ප.හ.ප්‍ර.ස) පිහිටුවා තිබුණද සමාලෝචිත වර්ෂයේ සමාගමේ ව්‍යාපාති සැලසුම්කරණය, ගිණුම් පිළියෙල කිරීම, පරිපාලනය සහ මානව සම්පත් කළමනාකරණය ඇතුළු සියළුම කාර්යයන් මව් සමාගම විසින් මෙහෙයවා තිබුණි.

(ඇ) ශ්‍රී ලංකා ප.හ.ප්‍ර.ස පිහිටුවීම සම්බන්ධයෙන් වන 2005 මැයි 19 දිනැති අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් වාර්තා අනුව, එය ස්වයං මූල්‍යායන ආයතනයක් විය යුතුය. තවද වසරක කාලයක් දක්වා ශ්‍රී ලංකා ප.හ.ප්‍ර.ස හි මෙහෙයුම් සඳහා මූල්‍යායනය තො.ස.තා.නි විසින් දරනු ලබන අතර ඉන්පසු ස්වකීය ආදායම් මූලාශ්‍ර ජනනය කරගැනීම මගින් එය ස්වාධීනව ක්‍රියාත්මක විය යුතුය. කෙසේ වෙතත්, සමාගම පිහිටු වීමේ සිට වසර 12 ක් ඉක්මවීමෙන් පසුවද එය සම්පූර්ණයෙන් ඒකාබද්ධ අරමුදල මගින් මූල්‍යනය වී පවතී.

3.3 කාර්ය මණ්ඩල පරිපාලනය
--------------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) 2003 ජූනි 02 දිනැති අංක පීඊඩී/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 9.2 වගන්තිය අනුව මානව සම්පත් අයවැය හා ඒකාබද්ධ, මානව සම්පත් සැලසුම පිළියෙල කළයුතු අතර එය භාණ්ඩාගාරයේ රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවේ ලියාපදිංචි කළ යුතුය. කෙසේ වෙතත්, විගණනය වෙත ඉදිරිපත් කරන ලද තොරතුරු අනුව එවැනි සැලසුමක් ශ්‍රී ලංකා ප.හ.ප්‍ර.ස විසින් පිළියෙල කර නොතිබුණි.

(ආ) 2003 ජූනි 02 දිනැති අංක පීඊඩී/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 9.3.1 වගන්තියෙන් නියම කර ඇති අවශ්‍යතා අවධාරණය කර එක් එක් තනතුරු සඳහා බඳවා ගැනීමේ සහ උසස් කිරීමේ පටිපාටියක් ප.හ.ප්‍ර.ස විසින් පිළියෙල කර නොතිබුණි.

(ඇ) 2003 ජූනි 02 දිනැති අංක පීඊඩී/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 9.6 වගන්තිය අනුව සමාගම විසින් ඒකාකාරීව සහ ක්‍රමවත් ක්‍රියාපටිපාටියක් අනුගමනය කරමින් කාර්යසාධන ඇගයීම් සිදුකර නොතිබුණි.

(ඈ) අනුමත කාර්ය මණ්ඩලයක් සහ බඳවා ගැනීමේ පටිපාටියක් නොමැතිව කොන්ත්‍රාත් පදනම මත ආයතනයේ සියළුම සේවකයන් සහ උපදේශකයන් පත්කර තිබුණ අතර වෙළඳපල අගයන් මත පදනම්ව වැටුප් ගෙවා තිබුණි. කෙසේ වෙතත්, චක්‍රලේඛ උපදෙස් අනුව වැටුප් පරිමාණ සඳහා අමාත්‍යාංශ හෝ භාණ්ඩාගාරයේ අනුමැතිය ලබාගෙන නොතිබුණි. තවද 2003 ජූනි 02 දිනැති අංක පීඊඩී/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 9.7 වගන්තියෙහි නියම කර ඇති අවශ්‍යතා අවධාරණය කිරීමකින් තොරව සමාගම විසින් උපදේශකයින් සඳහා වැටුප් සහ දීමනා ගෙවා තිබුණි.

(ඉ) වැටුප් ගෙවීම සඳහා පුනරාවර්තන ප්‍රතිපාදන වෙන්කිරීමකින් තොරව ව්‍යාපෘති සඳහා වෙන්කරන ලද ප්‍රාග්ධන ප්‍රතිපාදන උපයෝගී කර තිබුණි.

04. ගිණුම්කටයුතුභාවය සහ යහපාලනය
-----------------------------------------

4.1 ප්‍රසම්පාදනය සහ කොන්ත්‍රාත් ක්‍රියාවලිය
---------------------------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ මාර්ගෝපදේශ 4.2.1 අනුව සමාගම විසින් සමාලෝචිත වර්ෂය සඳහා ප්‍රධාන ප්‍රසම්පාදන සැලැස්මක් සහ විස්තරාත්මක ප්‍රසම්පාදන සැලැස්මක් පිළියෙල කර නොතිබුණි.

(ආ) ජාතික සහතිකරකරණ අධිකාරිය ව්‍යාපෘතිය සහ සයිබර් ආරක්ෂණ සහ ඩිජිටල් අධිකරණ යටිතල පහසුකම් වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතිය යන ව්‍යාපෘතීන් දෙක සඳහා 2016 වර්ෂයේ ක්‍රියාත්මක කිරීමට සැලසුම්කරන ලද ප්‍රසම්පාදනයන් 9 ක් අතරින් 2016 දෙසැම්බර් 31 දින වන විට ප්‍රසම්පාදනයන් 2 ක් පමණක් පිරිනමා තිබුණි.

(ඇ) සයිබර් ආරක්ෂණ ධාරිතා සහ යටිතල පහසුකම් සංවර්ධන ව්‍යාපෘතිය සහ සයිබර් ආරක්ෂණ සහ ඩිජිටල් අධිකරණ යටිතල පහසුකම් යන ව්‍යාපෘතීන් දෙක සඳහා 2017 වර්ෂයේ ක්‍රියාත්මක කිරීමට සැලසුම් කරන ලද ප්‍රසම්පාදනයන් 6 ක් අතරින් 2017 දෙසැම්බර් 31 දිනට ප්‍රසම්පාදනයන් 4 ක් පමණක් ප්‍රදානය කර තිබුණි.

(ඈ) පෙර වර්ෂයේ අරම්භ කරන ලද රෙඩියැට් බලපත්‍ර අළුත්කිරීමේ ප්‍රසම්පාදනය පෙර වර්ෂයේ ප්‍රසම්පාදන සැලැස්මට අතුලත් කර නොතිබුණි.

05. පද්ධති සහ පාලනයන්
-------------------------

විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලනයන්ගේ දූර්වලතා වරින්වර සමාගමේ සභාපතිගේ සැලකිල්ලට ගෙනඑනු ලැබීය. පහත සඳහන් පාලන ක්ෂේත්‍රයන් සම්බන්ධයෙන් විශේෂිත අවධානයක් යොමුවිය යුතුව පවතී.

| | පාලන ක්ෂේත්‍රය | නිරීක්ෂණය |
|---|---|---|
| | ------------------ | -------------- |
| (අ) | වත්කම් කළමනාකරණය | දේපළ, පිරියත හා උපකරණ ආගණනය, ලේඛනගත කිරීම, අයිතිය හුවමාරු කිරීම සහ ආරක්ෂා කිරීම සහ සම්පත් සමාගමේ පරමාර්ථ |

| | | |
|---|---|---|
| | | කාර්යක්ෂමව ඉටුවන අයුරින් උපයෝජනය සිදු නොකිරීම |
| (ආ) | මානව සම්පත් කළමනාකරණය | නීති සහ රෙගුලාසිවලට අනුව මානව සම්පත් සමාගමේ පරමාර්ථ මුදුන් පමුණුවා ගත හැකිවන පරිදි කළමනාකරණය නොකිරීම |
| (ඇ) | මූල්‍ය කළමනාකරණය | ඵලදායී මූල්‍ය කළමනාකරණ උපායමාර්ග භාවිතා කළ යුතුවීම. |